පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 8

විෂය - නර්තනය

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

නිපුණතා මට්ටම : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : **<u>ගැටබෙරය හා එහි වාදන අවස්ථා පිළිබඳ තොරතුරු විමසමු.</u>**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 7,8 ශ්‍රේණිවලදී පහතරට බෙරය හා දවුල පිළිබඳව ඉගෙනගත් දෑ මතකයට ගන්න.

දෙවන පියවර : පහත සටහන කියවා, පහත ප්‍රශ්නවලට ඔබට පිළිතුරු සැපයීය හැකිදැයි බලන්න.

1. ගැට බෙරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. ගැට බෙරය සකස් කිරීමට යොදාගන්නා ද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කරන්න.
3. ගැට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.
4. ගැට බෙරය වාදනය කරන අවස්ථා නම් කරන්න.
5. දේශිය වාද්‍ය භාණ්ඩ ආරක්‍ෂා කර ගැනිමට සුදුසු යෝජනා හා අදහස් ඉදිරිපත් කරන්න.

ගැට බෙරය :- උඩරට නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරය වේ. මැදින් ගැටයක් සේ පෙනෙන බැවින් මෙසේ හැඳින්වේ. බෙරයෙහි දෙපස වම් ඇස හා දකුණු ඇස වශයෙන් හඳුන්වා තිබීම මෙහි ඇති සුවිශේෂ ලක්ෂණයකි. කොහොඹ, ඇහැළ, කොස්, ගංසූරිය වැනි අරටු සහිත දැව බෙර කඳ සකස් කිරීම සඳහා යොදාගන්නා අතර, බෙරයේ වම් පස සඳහා හරක් හම නැතහොත් මවු හම ද, දකුණු පස සඳහා වඳුරු හම, එළුහම නැතහොත් තලගොයි හම ද යොදා ගැනීම සම්මත ක්‍රමය යි. සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව බෙරයෙහි දිග සඳහන් වන්නේ තුන් වියත් තුනඟුලකි. (අඟල් 27ක් පමණ) බෙරයේ මුහුනතෙහි විෂ්කම්භය විග්ගුස්සකි. (අඟල් 7-8ක් පමණ) එනම් වාදකයාගේ අත මිට මොළවා. මහපටැඟිල්ල හා දබරැඟිල්ල දිගු කිරීමෙන් ලැබෙන දිග විග්ගුස්ස නමින් හැඳින්වේ. ගැටබෙරයෙන් වාදනය වන බීජාක්ෂර සතර තත්, ජිත්, තොං, නං වේ. තත්, තොං යන අක්ෂර වම් පසින් ද, ජිත්, නං යන අක්ෂර දකුණු පසින් ද, වාදනය කිරීම සාම්ප්‍රදායික ක්‍රමය යි. බෙර වාදනයේ දී ධ්වනි ගුණය ආරක්ෂා කර ගැනීම සඳහා වාදන විධි ක්‍රම වැදගත් වේ. අක්ෂර භාවිතයේ දී ඒ ඒ ධ්වනි ගුණය ආරක්ෂා කරගැනීමට වාදකයා විසින් තම අත්ල නිවැරදි ක්‍රමවේදයන්ට අනුව භාවිත කළ යුතු ය. එහි දී එක් එක් අක්ෂර උපදවා ගැනීමට බෙර ඇස තුළ හස්ත ස්ථානගත කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ මගින් ධ්වනි ගුණයේ විවිධතා මතු කර ගැනීමට හැකි වනු ඇත.

වාදන අවස්ථා - ආගමික උත්සව - පිරිත් පින්කම්, පෙරහැර, තේවා වාදන අවස්ථා.
සමාජීය අවස්ථා - ශාන්තිකර්ම, උත්සව, සමාරම්භක අවස්ථා, සන්දර්ශන, තූර්යවාදන.

බෙරයේ කොටස්

